# සිංහලයෝ හෙවත් හෙළයෝ නම් කවරහුද ?

විශ්‍රාමික පාඨශාලාචාරිණී,
රූපා දිසානායක

මහා භාරතයේ හින්දු ගංගාධාරය ආසන්නයේ වගුරට නමින් රාජධානියක් විය. එය වර්තමානයේ රාජස්ථානය නමින් හැඳින්වෙතැයි සැලකිය හැකිය. වගු රජතුමාට සුප්පාදේවී නමින් රූපශ්‍රීයෙන් අගතැන්පත් දියනියක් සිටියේය. ඇගේ ජන්ම පත්‍රයෙන් එළි දැක්වුයේ ඇය කෙදිනක හෝ මාළිගාව හැර යන බවය. මින් ශෝකයට පත් මහරජ යුවල දැඩි ආරක්ෂා සහිතව මතු මහල් තලයේ තැබුවාය.

කල්යාමේදී සඳරැස් දසත ගලායන එක් රාත්‍රියකදී සීමැදුරු කවුළුවෙන් පිටත බලද්දී දර්ශණීය මනස්කාන්ත පරිසරයෙන් කුල්මත් වුවාය. ක්‍රම ක්‍රමයෙන් මතු මහලින් බිමට බැස්ස ඈ දුරින් ගමන් කරන සාක්තු වාහක වෙළඳ කණ්ඩායමකට එකතු වුවාය. මෙසේ ගමන් කරද්දී එක් වන ප්‍රදේශයක් සමීපයේදී හැඩි - දැඩි තරුණයෙක් වෙළඳ කණ්ඩායමට කඩා පැන්නේය. බියට පත් වූ වෙළෙන්දෝ ඒ මේ අත දිවයද්දී අහිංසක රජ කුමරිය තනි වුවාය. සිංහ නම් වූ ඒ චෞරයා බඩුත් රැගෙන කුමරිය ද කැටුව ගල් ගුහාවක් බඳු වූ ඔහුගේ නිවසට කැඳවාගෙන ගියේය.



කල්යාමේදී සිංහබාහු - සිංහසීවලි නමින් දරු දෙදෙනෙකුත් ද ලැබුවෝය. පිය සිංහ දවල් කල මේ තිදෙන ආරක්ෂිතව තබා ලෙන දෙර වසා ආහාර සොයා යාම සිරිතක් කොට ගත්තේය. වැඩිවියට පත් සිංහබාහු තම මවගේ සහ පියාගේ වෙනසට හේතු විමසීය. මව ඇති තතු පුතුට ප්‍රකාශ කළෙන් එක්තරා දිනක් පිය සිංහ ගුහාවෙන් පිටවු පසු තම මව හා නැගනිය දෙවුර මත වඩා හිඳුවාගන ගුහාවෙන් පිටත්විය. මෙසේ ගමන් කළ ඔවුනට හිතවත් ප්‍රදේශයාධිපතියෙකු වන අනුර ඇමති මුණගැසිණ. සියලු තොරතුරු වලට සවන් දුන් ඔහු ඔවුනට පහසුකම් ලබාදී නවතා ගත්තේය.

සවස් කල නිවසට පැමිනි පිය සිංහ හට සිදු වී ඇති දෙය තේරුම් ගත හැකි විය. අසල් වැසියන්ට තාඩන පීඩන කරමින් ප්‍රදේශය තුල මහත් කම්පනයක් ඇති කෙළේය. ගම්වාසීන්ට ඇතිවන කරදරය ක්‍රමයෙන් වැඩිවත්ම එය නොඉවසු අනුර ඇමති වැසියන් අමතා ප්‍රකාශ කර සිටියේ සිංහ මරා දමන අයෙකුට ප්‍රදේශයේ පාලන බලය ලබාදෙන බවයි. සිය පියා වුවද රට වැසියන්ට ඔහුගෙන් වන හිරිහ-ැරය ඉවසා ගත නොහැකිව රජ වාසින්ට වන සෙත සලකා සිංහ හමුවීමට යාමට මවගෙන් අවසර ඉල්ලා සිටියේය. එහෙත් මවගෙන් අවසර නොලද සිංහබාහු පියා මුණ ගැසීමට ගියේය. දෙදෙන එකිනෙකට මුහුණලා හමුවුහ. සිංහබාහු ඊතලය විදිද්දීත් දරු ප්‍රේමය නො-අඩුව තිබු නිසාදෝ ඊතලය අක්‍රීය විය. එහෙත් පිය සිංහගේ අවසානය දැකීමට කැමතිව ඊතලය මෙහෙය වද්දී සිංහ ගේ ක්‍රෝධයත් සමග මැරී වැටුනේය. සිංහබාහු තම වික්‍රමය අනුර ඇමතියාට පෙන්වුයේ සිංහගේ හිස පෙන්වීමෙනි.

පොරොන්දු වු පරිදි අනුර ඇමති සිංහබාහු ඒ ප්‍රදේශයේ පාලකයා බවට පත් කෙළේය. රජකුල චාරිත්‍රයක් ලෙසින් පැවති රාජ කන්‍යාවක්ම අභිෂේකයා සඳහා සම්මතයක් රටේ පැවති හෙයින් සිංහබාහු සිය නැගනිය සමග ආවාහ වන්ට සිදුවිය. මෙම විවාහයෙන් ඔවුනට දරුවෝ 32 ක් ලැබිණ. ඉන් වැඩිමලා විජය නම් විය. දෙවැන්නා සුමිත්‍ර නම් විය. තරුණ වියට පත් විජය කුමරු භයානක සොර මුලක ප්‍රධානියා බවට පත්විය. වැසියෝ මේ පිළිබඳව සිංහබාහු රජුට ප්‍රකාශ කළත් ඔහුගෙන් රට වැස්සන්ට වන හිරිහැර ඉවසාගත නොහි පිරිවර 700 දෙනෙකුත් අල්ලා හිස අඩක් මුඩු කොට රටින් පිටුවහල් කෙළේය.

ඔව්හු දකුණු ඉන්දියාවේ බටහිර වෙරළ හා නැගෙනහිර වෙරළ ඔස්සේ ගමන් කරද්දී ලංකාවේ වයඹ දිග වෙරළේ තම්මැන්නාව නම් ප්‍රදේශයෙන් ගොඩ බටුයේය. විජය ගොඩ බිමට බැස දෙ අත්ල තබා බැලීය. හේ දුටුයේ අත්දෙක තඹවන් පැහැයක් ගත් බවයි. හේ මේ රටට තාමපර්ණී දිවයින යයි නම් කෙළේය. ඇතුලට ගමන් කරද්දී කුවේණිය නම් වු ප්‍රදේශාධිපතියකුගේ දියනියක් හමු විය. ඕ විජය හා එක්වී වාසය කළාය. ජීවහත්ථ - දිසාල නමින් දරු දෙදෙනෙකුත් ද ලැබුවාය. නමුත් කල්යාමේදී විජයට රාජ කන්‍යාවක් හා ආවාහ වීමට අවශ්‍ය විය. ඒ රාජ චාරිත්‍රයක් වු නිසා ඔහු කුවේණිය හා දරු දෙදෙනා අත් හැර දැම්මේය. රාජ කන්‍යාවක් හා අවාහ වුවද විජයට දරුවන් නොවීය.

එහෙයින් ඔහු සිය සොහොයුරු සුමිත්‍ර කුමරුට දැන් වු නමුත් ඉන් ප්‍රයෝජනයක් නොලද විට පඩුවස් දෙව් කුමරු ගෙන්වා ගත්තේය. විජය සමග පැමිනි පිරිස රට සශ්‍රීක කිරීමේ යෙදුනහ. කල්යාමේදී පඩුවස් දෙව් කුමරුට ද රාජ්‍ය තන්ද්‍රය සදහා රාජ කන්‍යාවක්ම අවශ්‍ය විය. මේ වන විට අප බුදු රජාණන් වහන්සේගේ සුළු පිය රජෙකු වන ආමිතෝදන ශාක්‍ය රජුගේ දියනිය වන භද්දකාත්‍යානා කුමරියට කන්‍යාවන් පිරිසක් සමග කිසියම් හේතුවක් නිසා නැව් නැග ඒමට සිදුවිය. ලංකාවේ නැගෙනහිර වෙරළින් ගොඩ බට ඈ පඩුවස්දේව් කුමරු හා විවාහ වුවාය. ඉන් ඔව්නට පුතුන් නව දෙනෙක් හා එක් දියණියක් ලබා ගැනීමේ වාසනාව පෑදිනි. දියනිය නමින් උන්මාද චිත්‍රා වුවාය. ඇගේ ජන්ම පත්‍රය පිරික්සා බැලු මහ රජ යුවලට දැන ගන්නට ලැබුනේ කෙදිනක හෝ ඇය විවාහ වු දිනක ඇයට ලැබෙන පුත් කුමරකු විසින් සිය මාමාවරුන් මරා දමා රටේ රජකම ඔහු සතු කරගන්නා බවය. මෙයින් කම්පාවට පත් වු මවු පිය දෙදෙන ඇය එක්ටැම් මාලිගාවක තබා මුර සෙබලියක් ද තබා ආරක්ෂා කළාය. එහෙත් දෛවය ඉදිරියට හරස-'විනි. සිය මාමා කෙනෙකුගේ පුතනු කෙනෙක් වන දීඝ ගාමිණී කුමරු සමග පෙමින් වෙලි ගියාය. එහි ප්‍රතිපලයක් ලෙස පණ්ඩුකාභය නම් වු පුතෙක් ලැබීය. වැඩි වයසට පත් කුමරු තමන්ට විරුද්ධ වු මාමාවරු මරා දමා ගිරි කණ්ඩශිව නම් වු මාමාගේ දියනිය ස්වර්ණපාලි ආවාහ කර ගත්තේය.

අවුල් ජාලයක් බවට පත්ව තිබු රට සංසුන් කර අනුරාධපුර සිය රාජධානිය බවට පත් කරගත්තේය. වැව් අමුණු තනවා කෘෂි කර්මාන්තය දියුණු කර ආගමික සංවර්ධනයක් රට තුල ඇතිකොට වසර 70 ක් පමණ කාලයක් රට දැහැමෙන් සෙමෙන් පාලනය කෙළේය. ඔහුගේ පුත් මුටසිව රජු සහ ඔහු පුතනුවන්වන දේවානම්පියතිස්ස සහ මහානාග සෑපුන් මේ රට දියුණු කළෝය.

පසු කාලයේ සිංහ වංශිකයන් ශාක්‍ය වංශිකයන් හා නැදෑකම් ඇති කර ගත් බව තොරතුරු කියවන විට පෙනෙයි. කෙසේ වෙතත් ජාතිකත්වය හා ආගමිකත්වය තුලින් ඉදිරියට යාමේදී විවිධ ගැටුම් ඇතිවිය හැකිය. ඒවා ගණන් නොගෙන ජාතිය හෙවත් ඉපදීම ඇතිකර ගන්නේ අප කරන කුසල් හා අකුසල් තුලින් බව දැනගත යුතුය.

මනුෂ්‍ය වර්ගයාට අයිති අප හැම දෙනාම එකිනෙකා තුල ඇති කර ගත යුතුව ඇත්තේ අනුකම්පාව, කරුණාව, මෛත්‍රිය වැනි සාධු ගුණධර්ම තුලින් බව දැන ගත යුතුව ඇත. එබැවින් සමානාත්මතාවය හා සහජීවනය තුලින් රටේ දියුණුව කරා යෑමට හැකි හැම උත්සාහයක්ම දරමු.

## සිංහ පෙළපත




මේ අයුරින් පෙළපත ඉතිහාසයේ මැනවින් විදහා දැක්වෙනු ඇත. කල්යාමේදී "හ" කාරය වෙනුවට "ස" කාරය ආදේශ වීත්මන් හෙළයේ හෙවත් සිංහලයෝ කවර හෙයින් සිංහලයෝ විනිදැයි ඔබට තේරුම් යනු ඇත. සිංහ ගෝත්‍රයේ අයෙකු වු සිංහගේ පරම්පරාව සිංහ නමින් ඇති වී ව්‍යවහර පහසුව සඳහා පසු කාලයේ සිංහලයෝ වීම පුදුමයක් නොවේ.

එසේ හෙයින් එදත් අදත් මතුවටත් සිංහලයෝ තමන්ගේ ධීර - වීර - ශූර ගති පානු ඇතැයි සිතීමට ඉඩ තිබේ. එබඳු පුවුධ ඉතිහාසයක් ඇති සිංහලයන් තමන් සිංහ කුලයෙන් පැවති එන බව පෙන්වීමට මෙසේ සිංහ කොඩියක් නිර්මාණ්‍ය කර ලෝකයා අභිමුඛයට ඉදිරිපත් කර ඇත.

**සියලුම ජෝතිශ්‍ය කටයුතු**

දෙස් විදෙස් කේන්ද්‍ර සෑදීම, පලාපල ලියා දීම,
කරදර ගැටළු වලට පිළියම්, අපල වලට පිළියම් හා වාර්තා......
විවාහ සීහුම්, පොරොන්දම් ගැලපීම, දෝෂ විමසීම හා මඟහරවා ගැනීමට උපදෙස්.....
මංගල, මල්වර, නිවාස, විභාග, අකුරු කරවීමේ ශුභ නැකත්.......
නමට අකුරු, නම් තැබීම....
දල, සිරිපති, ක්‍රිෂ්ණමූර්ති හෝ ඕනෑම ක්‍රමයකට කර දෙන්නෙමු.
*ඊ මේල්, දුරකතන මගින් විශේෂ කඩිනම් සේවා.......*
රහස්‍යභාවය සුරකිමු
**සුබෝධා ජෝතිශ්‍ය සේවය**
www.subodha-inc.com.au
0420682644/ 0433536097
subodha.inc@email.com

**VCE Chemistry 2013**

Individual and Groups
Early completion of syllabus and Exam preparation
Home Visited

**Priyantha Liyanage 0407664546**